# කලාප අධ්‍යාපන කාර්යාලය

## පළමු වාර ඇගයීම - 2019 මාර්තු

### විෂය - නාට්‍ය හා රංග කලාව

I පත්‍රය

| S7 | S | I |
|---|---|---|

10 ශ්‍රේණිය කාලය පැය 03 කි.

- **1 සිට 40 දක්වා සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන පදය හා ගද්‍ය පාඨ ආශ්‍රයෙන් 01 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**A-** ගම මහගේ - ''තෝව දෙන්නෙත් නරියටයි - තෝව ගන්නෙත් නරියෙකුයි
තෝව දෙන්නෙත් තෝව ගන්නෙත් - කැලේ ඉන්නා නරියෙකුයි''

**B-** රජු - ''මට දවල් වෙනකල් බුදියගන්ඩ ඕනෑ
මහා ඇමති - එසේය මහරජතුමනි
රජු - මේ වන්දිභට්ටයින්ගේ ගයනාව නතර කරන්ඩ ඕනෑ''

**C-** මිළිඳු රජ - ''එසේ වී නම් නියපොතු, දත්, සම්, මස්, සාර, ආදිය නාගසේනද?
නාගසේන ස්ථවිර - නැත මහරජාණෙනි.''

**D-** භිහන්නා - ''මෙලොව දී තව තව ලැබේවා - එලොව දී දුක නැතුව ඉන්න
දිව මාළිග පහළ වෙන්න - පිනට මොකුත් මට ලැබෙන්න''

**E-** ''කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනින් එනවා
මිනිරන් තේරුවොත් ළඳ නුඹ කළු වෙනවා
ලඟ නම් ගෙදර මුර ඇරුණම මම එනවා''

**01.** සුභ සහ යස නාට්‍යය අයත් පද්‍ය / ගද්‍ය පාඨයකි.
i. A ii. B iii. C iv. D

**02.** ජන ජීවනයේ රැකියාවක් හා සම්බන්ධ පද්‍ය/ගද්‍ය පාඨයකි.
i. A ii. B iii. C iv. D

**03.** ජන කථාවක් ඇසුරෙන් මාහාචාර්ය සරත්චන්ද්‍රයන් විසින් රචිත නාට්‍යයකි.

i. A ii. B iii. C iv. D

**04.** බෞද්ධ පූජාකර්මයකට අයත් වන්නකි.

i. A ii. B iii. C iv. D

**05.** රබන් පද ඇසුරෙන් නිර්මාණය කරන ලද නාට්‍යයකට අයත් වන්නකි.

i. A ii. B iii. C iv. D

**06.** නාට්‍ය කලාව සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

i. සාමූහික කලාවකි.
ii. සෞන්දර්ය ක්‍රියාවලියකි.
iii. කලා කෘතියකි.
iv. භාරදූර නර්තනයකි.

**07.** එම නාට්‍ය කලාව මෙහෙයවන්නේ,

i. නිෂ්පාදකවරයා ය.
ii. පිටපත් රචකයා ය.
iii. අධ්‍යක්ෂක වරයා ය.
iv. නළු නිලියන් ය.

**08.** නෘත්ත නෘත්‍ය හා නාට්‍ය අතරින් වඩාත් පරිපූර්ණත්වය හිමි වනුයේ,

i. නෘත්තවලට ය.
ii. නෘත්‍යවලට ය.
iii. නාට්‍යවලට ය.
iv. නෘත්‍ය නාට්‍යවලට ය.

**09.** සතර අභිනයේ නාට්‍ය කලාවට වඩාත් සුවිශේෂී වූ අභිනය.

i. ආංගික අභිනයයි.
ii. වාචික අභිනයයි.
iii. සාත්වික අභිනයයි.
iv. ආහාර්ය අභිනයයි.

**10.** සාත්වික අභිනය ප්‍රකාශ කිරෙමේ දී නළුවාගේ වඩාත් වැදගත් වන්නේ,

i. මුහුණ ය.
ii. අත් හා පාද ය.
iii. වචන ය.
iv. රංග වස්ත්‍ර ය.

**11.** හරතමුනිගේ 'නාට්‍ය ශාස්ත්‍රයේ' ඇතුලත් ප්‍රධාන නාට්‍ය ප්‍රභේද වනුයේ,

i. නාට්‍ය ධර්ම හා ශෛලිගත නාට්‍යය.
ii. නාට්‍ය ධර්ම හා තාත්වික නාට්‍යය.
iii. නාට්‍ය ධර්ම හා මිශ්‍ර ශෛලිගත නාට්‍යය.
iv. නාට්‍ය ධර්ම හා ලෝක ධර්ම නාට්‍යය.

**12.** රූකඩ නාට්‍යයක ප්‍රධාන ශිල්පියා වන්නේ,

i. සූත්‍ර ධාර ය.
ii. බහුබූතයා ය.
iii. පොතේ ගුරු ය.
iv. කථකයා ය.

**13.** දොරකඩ අස්ස ඉදිරිපත් කරන්නේ,

i. දොරටුපාලකයා ලෙස ය. iii. දේව දූතයා ලෙස ය.

ii. හඬ දූතයා ලෙස ය. iv. අතීත වක්තෘ ලෙස ය.

**14.** නාට්‍යයක් නිර්මාණය කළ පසු එහි පැවැත්ම රඳා පවතින්නේ,

i. නාට්‍ය පෙන්වන දර්ශන වාර මත ය.

ii. අධ්‍යක්ෂකගේ හා නළු නිළියන්ගේ කැපවීම මත ය.

iii. වේදිකා පරිපාලක හා ආනුශාංගික ශිල්පීන්ගේ සහය මත ය.

iv. ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ය.

**15.** පාලමකින් එගොඩ විය යුතු ආකාරය දැක්විය යුතු චලනය,

i. නිර්මිත චලනයකි. iii. ස්වභාවික චලනයකි.

ii. තාලානුකූල චලනයකි. iv. රිද්මයානුකූල චලනයකි.

❖ **පහත තොරතුරු ආශ්‍රයෙන් අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**A.** **වේෂ භූෂණය, අංග රචනය, රංග භාණ්ඩ.**

**B.** **රූපණය, සමාරෝපය, අනුකරණය.**

**C.** **රංග විධාන, සංවාද, චරිත.**

**D.** **දිව, කණ, නාසය.**

**E.** **නළල, නාසය, කම්මුල්.**

**16.** 'A' අක්ෂරය සඳහා වඩාත් සුදුසු වන්නේ,

i. සතර අභිනය යි. iii. ආනුෂංගික අංග යි.

ii. පසුතල නිර්මාණය යි. iv. රූපණය යි.

**17.** 'B' අක්ෂරයෙන් දැක්වෙන කොටස් වඩාත් වැදගත් වන්නේ,

i. රංගාලෝක ශිල්පියාට ය. iii. නළුවාට ය.

ii. අධ්‍යක්ෂකවරයාට ය. iv. ප්‍රේක්ෂකයාට ය.

**18.** අංග රචනයේ දී වැදගත් වන කොටස ඇතුලත් වන්නේ,

i. A ii. C iii. D iv. E

**19.** 'C' අක්ෂරයෙන් දැක්වෙන අංග වඩාත් උචිත වන්නේ,

i. අධ්‍යක්ෂක වරයාට ය. iii. ප්‍රේක්ෂකයාට ය.

ii. නාට්‍ය පෙළට ය. iv. ආනුෂංගික ශිල්පීන්ට ය.

**20.** සංවේදන අභ්‍යාස සඳහා සුදුසු වන්නේ,

i. A ii. C iii. D iv. E

❖ පහත සඳහන් කලා මාධ්‍ය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| **A.** | චිත්‍ර | **C.** | කැටයම් | **E.** | ඔපෙරා |
| **B.** | මුද්‍රා නාට්‍ය | **D.** | චිත්‍රපට | **F.** | මූර්ති |

**21.** ඉහත කලා මාධ්‍ය අතරින් දෘශ්‍ය කලා ගණයට අයත් වන්නේ,

i. A C E    ii. B D E    iii. C E F    iv. A C F

**22.** මෙයින් ශ්‍රව්‍ය දෘශ්‍ය කලා වන්නේ,

i. A D E    ii. B D F    iii. C E F    iv. B D

❖ **පහත සඳහන් නාට්‍ය ගීත ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

- **දී කිරි දී කිරි**
- **සොබාව දේ මෙපුර**
- **හනික වරෙව් කොල්ලනේ**
- **යුද්දෙට මං ගියා**

**23.** ඉහත ගීත ඇතුලත් නාට්‍ය පිලිවෙලින් දැක්වෙන්නේ,

i. රතු හැට්ටකාරි, බෙර හඬ, තාරාවෝ ඉගිලෙති, හුණුවටයේ කතාව

ii. මනමේ, මූදු පුත්තු, බෙර හඬ, හුණුවටයේ කතාව

iii. තාරාවෝ ඉගිලෙති, රතු හැට්ටකාරී, බෙරහඬ, හුණුවටයේ කතාව

iv. හුණුවටයේ කතාව, රතු හැට්ටකාරී, බෙර හඬ, තාරාවෝ ඉගිලෙති

**24.** ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කරගත හැකි වනුයේ,

i. සංවේදන අභ්‍යාස තුලිනි.

ii. දර්පණ අභ්‍යාස තුලිනි.

iii. රංග ක්‍රියා තුලිනි.

iv. මින් එකක්වත් නොවේ.

**25.** ආ.....ස.......ර......ල..... වැනි ශබ්ද නැගෙන අයුරින් හඬ නැගීම සිදු කරන ආකාරය වන්නේ,

i. ශිථිලකරණ අභ්‍යාස

ii. දර්පණ අභ්‍යාස

iii. සංවේදන අභ්‍යාස

iv. ශ්වසන අභ්‍යාස

❖ පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් **26-30** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A



B



C



D



E

**26.** ස්පාඤ්ඤ ජාතික ෆෙඩ්රිකෝ ගාර්ෂියා ලෝර්කාගේ යෙර්මා නාට්‍ය ඇසුරෙන් අනුවර්තන නාට්‍යයක් නිෂ්පාදනය කරන ලද්දේ,

i. A ii. B iii. C iii. D

**27.** ළමා නාට්‍ය සම්බන්ධයෙන් ජනප්‍රියත්වයට පත්වූයේ,

i. A ii. B iii. C iii. D

**28.** මධුර ජවනිකා, ආනන්ද ජවනිකා නාට්‍ය නිර්මාණය කරමින් චාර්තා රංගනය හඳුන්වා දෙන ලද්දේ,

i. A ii. B iii. C iii. D

**29.** 1970 සිට දශක තුනක් සිංහබාහු චරිතයට පනපොවමින් චාර්තාගත රංගනයක් ඉදිරිපත් කරන ලද්දේ,

i. A ii. B iii. C iii. D

**30.** 'මෝදර මෝල', 'සරුනැති ලොව', 'මෙස' වැනි නාට්‍ය රසක් බිහි කරමින් රන්ජිත් ධර්මකීර්ති මහතා දැක්වෙන්නේ,

i. A ii. B iii. C iii. D

❖ **31-35 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන වරණය තෝරන්න.**

**31.** නාට්‍යයක සංගීත නිර්මාණය කළයුතු වන්නේ,

i. සංගීත අධ්‍යක්ෂකවරයාගේ අභිමතය පරිදි ය.

ii. නාට්‍ය ශෛලිය අනුව ය.

iii. නාට්‍යට සංගීතය අවශ්‍යම නොවේ.

iv. නාට්‍යය අභ්‍යාස අතර සම්බන්ධතාව රඳවා ගැනීමට ය.

**32.** "නාට්‍යයක් නැරඹීමේ චේතනාවෙන් විශේෂයෙන් පැමිණෙන පුද්ගලයා ප්‍රේක්ෂකයා වේ" යනු නාට්‍යයේ,

i. රසිකයෙකි. iii. විචාරකයෙකි.

ii. විනිශ්චයකරුවෙකි. iv. අයිතිකරුවෙකි.

**33.** නාට්‍ය ගීතයක හිතකර ලක්ෂණ වනුයේ,

i. තනුවේ සරල බව ය. iii. පුළුල් නාද පරාසය ය.

ii. සරල පද මාලාව ය. iv. නාට්‍යය ගුණය ය.

**34.** අංග රචනයෙන් චරිතයක ඉස්මතු කළ හැකි ලක්ෂණ වනුයේ,

i. චරිතයේ සමාජ පසුබිම iii. ආගමික ඇදහිලි

ii. වයස iv. මනෝභාව.

**35.** හොඳ නළුවෙක් නම්,

i. දුරුකරන ලද සබ කොලය ඇත්තෙක් විය යුතු ය.

ii. මනා ධාරණ ශක්තියක් තිබිය යුතු ය.

iii. නාට්‍ය අධ්‍යක්ෂකවරයා සමඟ සහයෝගයෙන් කටයුතු කල යුතු ය.

iv. අත්‍යවශ්‍යයෙන්ම මිහිරි කටහඬක් තිබිය යුතු ය.

❖ **පහත තොරතුරු ඇසුරෙන් 36-40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**A.** **විවිධ හැඩතල මතු කිරීමටත්, රේඛා ඇඳීමටත් භාවිත කරයි.**

**B.** **රවුල් ඇලවීමටත් නෝස් පොටි භාවිතයටත් උපයෝගී කොටගැනේ.**

**C.** **මුහුණේ පමණක් නොව ශරීරයේ ඇතැම් තැන්වල විවිධ හැඩ සකස් සඳහා යොදා ගනියි.**

**D.** **හණ හා කෘතීම කෙඳි විශේෂයකි. කළු, දුඹුරු, සුදු වර්ණ වලින් ලබාගත් හැක.**

**36.** A හි සඳහන් අර්ථය නිරූපණය සඳහා යොදාගනු ලබන්නේ,

i. මේකප් පෙන්සිල්
ii. රිමුවින් ක්‍රීම්
iii. ස්පොන්ජ්
iv. පැන් කේක්

**37.** B හි සඳහන් අර්ථය නිරූපණය කිරීමට අංගරචන ශිල්පියා යොදාගනු ලබන්නේ,

i. ලයිනින් කලර්ස්
ii. ක්‍රේප් හෙයාර්
iii. ස්ප්‍රීට් ගම
iv. නෝස් පොටි

**38.** C හි සඳහන් අදහසට වඩාත්ම සුදුසු වන්නේ,

i. පවුඩර් පෆ් ii. ටූත් එනමල් iii. නෝස් පොටි iv. ස්පොන්ච්

**39.** ටූත් එනමල් යොදාගනු ලබන්නේ,

i. B ii. C iii. D iv. E

**40.** ක්‍රේප් හෙයාර් සඳහා වඩාත් සුදුසු අක්ෂරය,

i. A ii. C iii. D iv. E

# කලාප අධ්‍යාපන කාර්යාලය

## පළමු වාර ඇගයීම - 2019 මාර්තු

### විෂය - නාට්‍ය හා රංග කලාව

**II පත්‍රය**

| S7 | S | I |
|---|---|---|

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 කි.**

❖ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇත. එම සම්පූර්ණ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

- අනිවාර්ය ප්‍රශ්නය

01.

i. නාට්‍ය යන්න පිලිබඳ විද්වතුන් පැවසූ නිර්වචනයක් ලියන්න.

ii. වර්තමානයේ නාට්‍ය ඉදිරිපත් කරන රංග භූමියක නම ලියන්න.

iii. චිත්‍රපටය නාට්‍යයෙන් වෙනස්වන ප්‍රධාන ලක්ෂණයක් දක්වන්න.

iv. කතාන්දරය නාට්‍යයක් බවට පත් කරන්නේ කවරෙක්ද?

v. කතාන්දරයක හා නාට්‍යයක දැකියහැකි සමාන ලක්ෂණ දෙකක් පෙන්වා දෙන්න.

vi. කතාන්දරයකට වඩා නාට්‍යයක දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් දක්වන්න.

02.

i. නෘත්ත යනු කුමක්ද?

ii. නෘත්ත හා නෘත්‍ය සඳහා භාවිත අභිනයක් දක්වන්න.

iii. නෘත්ත හා නෘත්‍යයේ ලක්ෂණ උදාහරණ දෙමින් පහදන්න.

03.

i. රංග භූමිය යන්න හඳුන්වන්න.

ii. නූතන රංග භූමියේ මනක්කල්පිත බෙදීම් ඇඳ දක්වන්න.

iii. රංග භූමියක තිබිය යුතු මූලික ලක්ෂණ මොනවාද?

04.

i. "සමාරෝපය" යන්න අර්ථ දක්වන්න.

ii. "සමාරෝපයේ" ප්‍රභේද කෙටියෙන් පහදන්න.

iii. චරිතයකට සමාරෝපය වීමට නළුවෙකු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවාදැයි විස්තර කරන්න.

05.

i. ප්‍රධාන නාට්‍ය ශෛලි නම් කරන්න.

ii. ඒ සඳහා උදාහරණ දෙක බැගින් දෙන්න.

iii. ඉන් එක් නාට්‍ය ශෛලියක් පිළිබඳ ඔබ දුටු නාට්‍යයක් ඇසුරෙන් විස්තර කරන්න.

06.

i. වේදිකාවට බැහැරින් ගෙන එන කලා අංග හඳුන්වන්නේ කුමන නමකින්ද?

ii. එම කලා අංග තුනක් නම් කර ඒවා අයත් අභිනය ලියා නම් කරන්න.

iii. ඔබ දුටු වේදිකා නාට්‍යයක එම කලා අංග යොදාගෙන කියූ ආකාරය විස්තර කරන්න.

07. පහත සඳහන් කතා සැකිල්ල ඔබ කැමති අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

**පියා නිවසේ නැති අවස්ථාවක දී අලුතෙන්ම නිවසට ගෙන ආ යතුරු පැදිය නිවසට හොරෙන් තම මිතුරෙකු ද සමඟ පදින්නට යන පසිඳු අතින් එය පෙරළී දෙදෙනාම සුළු තුවාල ලබයි.**

i. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය .

ii. සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම.